# යොවුන් සමාජ
(e-magazine)

12/08/2016

## තරුවක් සමඟ වරුවක්

සමන්ත වර්ණකුලසූරිය



**1.ඉතින් කොහොමද ශනුද්රී මොනවද අලුත් විස්තර?**

මේදවස්වල නම් වීවේකයෙන් ගෙදරටවෙලා විවේකීව ඉන්නවා. හොද නිර්මාණ ආවොත් ඉදිරිපත් වෙන්න අසහසක් තියෙනවා.ඊට අමතරව කුකරි ක්ලාස් එකකටත් යනවා. අම්මිට උයන්න ලේසී මොකද මම ගෙදරදී practice කරන නිසා.

**2.කුකරි ක්ලාස් යන්නේ ලඟදී කාටහරි උයන්නවත් අදහක් තියෙද?**

අනේ එහෙම දෙයක් නැහැ. ගැහැණු ළමයෙක් වශයෙන් අපි සේරම දේවල් දැනගෙන ඉන්න ඔනේ. නැතුව ඔයා අදහස් කරපු දෙයක් නැහැ.

**3.ඔයාට පිරිමි ළමයි 64(සික්ටිෆෝ) කියනකොට තරහා එනවා නේද?**

කවුද කියන්නේ මට නම් තරහා යන්නේ නැහැ. මට එක්තරා සජීවී වැඩ සටහනකදී ඇත්තටම අමතක උනා උත්තරය. අනික මට උ/පො පොදු පරීක්ෂණ පේපර් එකට ලකුණු 85ක් තිබුනා.

ලංකාවේ ඉතිහාසය ගැන මම හොදට දන්නවා. අනික තමයි ලංකාව ගැන විතරක් නෙවෙයි මම විනෝදාංෂයක් හැටියට පිටරටවල ඉතිහාසය ගැනත් අන්තර්ජාලයෙන් හොයලා කරුණු හදාරලා තියෙනවා.

එදා ඔය සිද්ධිය උන වෙලාවේ මගෙ ලගින් හිටපු මිතුරන් පවා පුදුම උනා ඇයි මෙච්චර දැනුමක් තියෙන මට මේ පොඩි දෙය අමතක උනේ කියලා.

අනික මම පාසල් කාලයේ ඉංග්‍රීසි භාෂාවෙන් තමයි අධ්‍යාපනය හැදෑරුවේ. විශේෂයෙන් ඇමරිකානු ඉංග්‍රීසි ඉතින් මට භාෂාමය ප්‍රශ්නයකුත් තිබුණා.

**4.කොහොමද ඔයාට තියෙන ආකර්ෂණය එහෙම තරුණ පරපුර අතර?**

අ◌ැත්තටම මම සතුටු වෙනවා කෙටි කාලයක් ඇතුලත මට රසික රසිකාවියන් ගොඩක් ලැබීම සම්බන්ධව.විශේෂයෙන් පොඩි නංගිලා මල්ලිලා මට ලියුම් පවා එවනවා පුද්ගලිකව

## INTERVIEW WITH SHANUDRI PRIYASAD

**5. රසික රසිකාවියන් ඔයාගේ මොන ගුණයටද තදින්ම ආකර්ෂණය වෙන්නේ ඔයාට හිතෙන විදිහට?**

0ඒක පැති කිහිපයකින් කියන්න පුළුවන්.ගොඩක් වෙලාවට භාහිර ඔපය තමයි ගොඩක් වෙලාවට මගෙ ආකර්ෂණයට හේතුවෙලා තියෙන්නේ.

එක එක කාලවලදී එක එක රැලි එනවා විශේෂයෙන් ඇමරිකාව හරහා තමයි මෙවායේ විකාශය සිදුවන්නේ.

Kim Kardashian හරහා මතුවී ගිය රැල්ලට ලංකාවේද උප සංකෘතියක් දැන් බිහිවේගෙන යනවා.

එක අපි බුටි(booty) සංකෘතිය කියලා තමයි නම් කරන්නේ. ලංකාවේ ඒ සඳහා හොදම තරඟයක් දීමට මමත් නටාෂා රත්නායක අක්කිත් තමයි ඉදිරියෙන් ඉන්නේ. ඉතින් මම හිතනවා බටහිරබල පෑමත් එක්ක අන්න ඒ හේතුව තමයි මගේ ජනප්‍රිය තාවයට හේතුවක් වෙලා තියෙන්නේ.

Miss sexy back booty contest 2017 Brazil තරගය සඳහා ලංකාවේ නියෝජනය කිරීමට මම සුදානමින් සිටිනවා. ලබන අවුරුද්ද ඒ සඳහා ගොඩක් කැප කිරීම් කරන්න තියෙනවා. එමගින් ලංකාවට ගෞරවයක් ගෙන ඒමටත් හැකි වෙයි කියලා මම හිතනවා.

**6. ලංකාව වගේ රටක් ඒවගේ තරඟයක් සඳහා සහභාගී වීම උචිතදැයි ඔබ සිතනවාද?**

දියුණුවෙන ලෝකයත් එක්ක අපි ඉදිරියට ගමන් කරයුතු වෙනවා. එතකොට තමයි අපිට රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන්වෙන්නේ. හැමදෙයක් ගැනව විවෘත මනසකින් සිතන්න තමයි මම පුරුදුවෙලා තියෙන්නේ.

දැන් බලන්න ඉන්දියාව ගොඩක දියුණුවෙලා තියෙනවා. ඉන්දියාවේ මේ අවස්ථාව ගන්න සැහෙන පිරිසක් පොරකනවා. ඇත්තටම එයාලගෙ සමාජය දැන් හරි open හිතන්න පුරුදුවෙලා තියෙන්නේ.

අන්න එහෙම ඔපන් හිතන්න පුළුවන් රටවල් තමයි අද ලෝකයේ දියුණු වෙලා තියෙන්නේ...

**8. අනාගත පරපුරට සනුද්රී අක්කාගෙන දෙන්න තියෙන පණිවිඩය කුමක්ද?**

තමන් කුමකට හෝ දක්ෂ යැයි හැගෙනවා නම් ඉක්මනටම ඒක කරන්න පටන් ගන්න. එක මොහොතක්වත් නිකරුනේ කාලය කාදන්න එපා. භාහිර සමාජය ඔබව වට්ටන්න හදාවි සැලෙන්න එපා. දිගටම කරගෙන යන්න. ඔබලා කවදා හරි දියුණුවෙයි.

**9. දේශපාලනයට ආරාධනාකරොත්**

මම පෞද්ගලිකව දේශපාලනයට කැමැති නැහැ. නමුත් මට තව කෙනෙතුට උදව් කරන්න අවස්ථාවක් ලැබෙනවා නම් මම

**මම ගොඩක් ඉස්තුති වන්න වෙනවා යොවුන් සමාජ e-magazine එකට. පුද්ගලිකව මම සඟරාව සැම කලාපයක්ම ගත්තා. මට ගොඩක් ජාති තනියෙම ඉගන ගන්න හැකියාවක් ලැබුනා මේ සඟරාව හරහා.**

**මම ගොඩක්ම ආසා කරන විශේෂාංගය තමයි universal studio කියන කොටස. අපිට ඇත්තටම ඇමරිකානු සිනමාව තාක්ෂණය අතින් අපිට වඩා අවුරුදු කීයක් ඉදිරියෙන් සිටිනවාද යන්න දැන ගන්න පුළුවන්....**






සනුද්රී අක්කිට කියලා. මම එයාලට ගොඩක් වෙලාවට රිප්ලයි කරනවා. හොඳට ඉගන ගන්න කියලා.

තරුණ අයියලා එහෙම නම් ගොඩක් වෙලාවට මාට සෙල්ෆි ගන්න කියලා තමයි කරදර කරන්නේ. සමහර වෙලාවට ඒක මට පෞද්ගලික වැඩ වලදී අපහසුතාවයන්ටත්

මුහුණ දෙන්න සිදුවෙලා තියෙනවා.

කුමන දෙයක් තුලින් හෝ එක් කරනවා.

දැනට නම් මම දේශපාලන ගැන වැඩි දැනීමක් නැහැ

**10. ඉදිරි වසර 10 ඇතුලත සනුද්රී කුමන පුද්ගලයෙක් වෙයිද?**

අ◌ැත්තටම මම ව්‍යාපාර පිළිබද උනන්දුවෙයි. මගේම කියා ඇඟලුම් හෝ නිම් ඇදුම් ව්‍යාපාරයක් කරගෙන යැමට හැකිවෙයි.

ඒ අතර තුර තෝරාගත් නිර්මාණ කිහිපයකට දායක වීමට කටයුතු කරයි.

බොහෝවිට මම අම්මා කෙනෙකු වීමටද පුළුවන්...